# කලාප අධ්‍යාපන කාර්යාලය - මතුගම

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය
Genaral Certificate of Education(Adv.Level) Examination

භූගෝල විද්‍යාව II
Geography II

22 S II

පැය තුනයි.
Three hours

**සැළකිය යුතුයි :**

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස- භෞතික භූගෝල විද්‍යාව

01) i) අ) පෘථිවියේ හරස්කඩක් ඇඳ එහි ප්‍රධාන ස්තර ලකුණු කර නම් කරන්න. *(ලකුණු 04)*
ආ) පෘථිවි අභ්‍යන්තරය පිළිබඳව තොරතුරු සනාථ කෙරෙන ඍජු හා වක්‍ර සාක්ෂි එක බැගින් **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 02)*
ii) සියල් හා සිමැග් ස්තර සැකෙවින් හඳුන්වන්න. *(ලකුණු 04)*
iii) අ) නිර්මාණය වන ආකාරය හා භෞතික තත්වයන් මත පාෂාණ බෙදෙන ප්‍රධාන කොටස් **තුන** නම් කරන්න. *(ලකුණු 1.5)*
ආ) ඉන් එක් වර්ගයක් පිළිබඳ හැඳින්වීමක් කරන්න. *(ලකුණු 2.5)*
iv) ආචාර්ය පානබොක්කේ (1961) විසින් ඉදිරිපත් කළ පාංශු සන අතරින් තෙත් කලාපයේ, වියළි කලාපයේ හා තෙත් හා වියළි කලාපයේ දක්නට ලැබෙන එක් පාංශු වර්ගය බැගින් පාංශු වර්ග **තුනක්** විස්තර කරන්න. *(ලකුණු 06)*

02) i) අ) ජෛව ගෝලය සැකෙවින් හඳුන්වන්න. *(ලකුණු 02)*
ආ) එහි සීමා මායිම් දක්වන්න. *(ලකුණු 03)*
ii) පරිසර පද්ධතියක ජෛව හා අජෛව සංරචක අතර ඇති නොබිඳිය හැකි සබඳතාවය පැහැදිළි කරන්න. *(ලකුණු 05)*
iii) පාරිසරික පිරමීඩ වර්ගවල ගුණාත්මක භාවය සාකච්ඡා කරන්න. *(ලකුණු 04)*
iv) පරිසර පද්ධතියක ශක්තිය ගලන ආකාරය උචිත රූපසටහන් ඇසුරින් පැහැදිළි කරන්න. *(ලකුණු 06)*

03) i) සපයා ඇති ලෝක ආකෘති සිතියමේ ලෝකයේ හුණුගල් භූ රූප පැතිර ඇති පහත ස්ථාන ලකුණු කර නම් කරන්න. *(ලකුණු 04)*

A. යුගෝස්ලෝවියාව B. තස්මේනියාව
C. යුකටාන් අර්ධද්වීපය D. මැලේසියාව

ii) හුණුගල් භූ රූප යනු මොනවාද? *(ලකුණු 06)*
iii) හුණුගල් ප්‍රදේශ ආශ්‍රිත ඛාදිත භූ රූප **තුනක්** රූපසටහන් ආධාරයෙන් විස්තර කරන්න. *(ලකුණු 06)*
iv) හුණුගල් නිධි සාදිත භූ රූප **තුනක** නිර්මාණ ක්‍රියාවලිය රූපසටහන් ආධාරයෙන් විස්තර කරන්න. *(ලකුණු 06)*

04) i) දේශගුණික වෙනස්වීම් යන්න සැකෙවින් හඳුන්වන්න. *(ලකුණු 02)*
ii) අ) හරිතාගාර ආවරණයට දායක වන වායු වර්ග **හතරක්** නම් කරන්න. *(ලකුණු 02)*
ආ) එම වායූන් තුනක විමෝචන මූලය බැගින් දක්වන්න. *(ලකුණු 03)*
iii) හරිතාගාර ආවරණය යන්න හඳුන්වා දී එහි ප්‍රතිවිපාක **තුනක්** සාකච්ඡා කරන්න. *(ලකුණු 07)*
iv) දේශගුණික වෙනස්වීම් හමුවේ ජාත්‍යන්තරයේ මැදිහත්වීම කෙබඳුද? යන්න පැහැදිළි කරන්න. *(ලකුණු 06)*

## II කොටස - මානුෂ භූගෝල විද්‍යාව


05) i) අ) ජනාවාසයක මූලික සංරචක **හතරක්** නම් කරන්න *(ලකුණු 02)*
ආ) ජනාවාස ධූරාවලිය නම් කරන්න. *(ලකුණු 03)*
ii) අ) නාගරීකරණය යන්න සැකෙවින් හඳුන්වන්න. *(ලකුණු 03)*
ආ) නාගරීකරණය ඇති කරන සාධක **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 03)*
iii) සංවර්ධනය වෙමින් පවතින කලාපය ආශ්‍රිතව නාගරීකරණය හේතුවෙන් උද්ගතව ඇති ගැටළු **තුනක්** සාකච්ඡා කරන්න. (කුණු කසල ගැටළුව හැර) *(ලකුණු 05)*
iv) ශ්‍රී ලංකාව ආශ්‍රිතව කුණු කසල අක්‍රමවත් ලෙස බැහැර කිරීමේ ගැටළුවට පිළියම් **තුනක්** යෝජනා කරන්න. *(ලකුණු 04)*

06) i) ශ්‍රී ලංකා ආකෘති සිතියමක පහත සඳහන් අපනයන ප්‍රවර්ධන කලාප ලකුණු කර නම් කරන්න.
*A. මීරිගම* *B. කටුනායක*
*C. කොග්ගල* *D. පල්ලෙකැලේ* *(ලකුණු 02)*
ii) අ) ඇඟළුම් කර්මාන්තය ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා බව උදාහරණ **තුනක්** මගින් පැහැදිළි කරන්න. *(ලකුණු 05)*
ආ) ඇඟළුම් කර්මාන්තය හමුවේ ශ්‍රී ලංකාව මුහුණ පාන ගැටළු **තුනක්** සාකච්ඡා කරන්න. *(ලකුණු 05)*
iii) නිෂ්පාදන කර්මාන්ත යන්න පැහැදිළි කරන්න. *(ලකුණු 02)*
iv) නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිතව බටහිර ලෝකය සතුව පැවති ආධිපත්‍යය ආසියාවට යොමු වීමට බලපෑ සාධක **තුනක්** සාකච්ඡා කරන්න. *(ලකුණු 06)*

07) i) ප්‍රධාන ජන සංඛ්‍යා පිරමීඩ වර්ග **හතර** නම් කරන්න. (*ලකුණු 02)*
ii) ජන සංඛ්‍යා පිරමීඩයක ස්වභාවය පැහැදිළි කරන්න. (*ලකුණු 05)*
iii) රටක ජන සංඛ්‍යා ගතිකත්වය කෙරෙහි බලපාන සාධක **තුන** නම් කර ඒ ආශ්‍රිත මිණුම් **තුනක්** සැකෙවින් හඳුන්වන්න. (*ලකුණු 07)*
iv) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව ජන සංඛ්‍යාව ආශ්‍රිතව දක්නට ලැබෙන ප්‍රවණතා **තුනක්** සාකච්ඡා කරන්න. (*ලකුණු 06)*

08) i) සංචාරකයා යන්න සැකෙවින් හඳුන්වන්න. *(ලකුණු 02)*
ii) අ) සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ප්‍රධාන සංචාරක කලාප **හතරක්** ලකුණු කර නම් කරන්න. *(ලකුණු 04)*
ආ) ඉහත (අ) හි නම් කළ සංචාරක කලාප **දෙකක්** කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 04)*
iii) සංචාරක කර්මාන්තයේ උන්නතියට ජාතික මට්ටමෙන් ගෙනැති පියවර සාකච්ඡා කරන්න. *(ලකුණු 04)*
iv) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ආර්ථික, සමාජයීය හා පාරිසරික බලපෑම තුලනාත්මකව සාකච්ඡා කරන්න. *(ලකුණු 06)*

*********************



N
පළාත් මායිම
மாகாண எல்லை
Provincial Boundary



30318

පරිමාණය 1:50 000
அளவுத்திட்டம் 1:50 000
Scale 1:50 000




සමෝච්ච රේඛා අන්තරය මීටර 20
சம உயரக்கோட்டு இடைவெளி 20 மீற்றர்
Contour Interval 20 Metres